# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2076/14 - 2018 ජූනි මස 19 වැනි අඟහරුවාදා - 2018.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## 1 වැනි කොටස : (I) ඡේදය-සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය
### දෙවන සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 දරන හා 2014.10.22 වැනි දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

එම්.ඒ.බී.දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජූනි මස 13 වැනි දින.


1A - G 27897– 08 (2018/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*අනු අංකය ඡේද අංකය සංශෝධනය විය යුතු ආකාරය*

01 18 18. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2020.10.22 දින දක්වා බල පැවැත්වේ.

**18. 1 අන්තර්කාලය තුළ උසස් කිරීම**

**18.1.1 II වන ශ්‍රේණියට උසස් කිරීම**

අන්තර්කාලය තුළ දී 3 පන්තියේ නිලධාරීන් II වන ශ්‍රේණියට උසස් කිරීමේ දී අංක 1086/26 දරන හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව ඇති නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 1 සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10.1.1හි (vii) හැර සඳහන් අනෙකුත් සුදුසුකම් සපුරන දිනට II වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

*සටහන*

i. අන්තර්කාලය තුළදී III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් සඳහා 18.1.1 යටතේ සඳහන් විධිවිධානයන් අදාළ නොවන අතර එම නිලධාරීන් II ශ්‍රේණියට උසස් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඇතුළු 10.1.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

**18.1.2. I ශ්‍රේණියට උසස් කිරීම**

අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම සමත්, 1 පන්තියට උසස් වීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරන නිලධාරීන් මෙම ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම 1 හා 2 සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10.2.1 හි (v), (vi) හා (vii) හැර අනෙකුත් සුදුසුකම් සපුරන දිනට 1 වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ 9.1ට අනුව රාජ්‍ය භාෂා පරීක්ෂණය සම්පූර්ණ කළ යුතුයි.

*සටහන*

1. අන්තර්කාලය තුළදී II ශ්‍රේණියට උසස් වන නිලධාරීන් සඳහා 18.1.2 යටතේ සඳහන් විධිවිධානයන් අදාළ නොවන අතර එම නිලධාරීන් I ශ්‍රේණියට උසස් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඇතුළු 10.2.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

ii. 2007.07.01 දිනට පසුව විදුහල්පති තනතුරට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා අනුශංගික චක්‍රලේඛ මගින් නියම කරනු ලැබ ඇති රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 9.1 යටතේ දක්වා ඇති සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

07-68

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.